# වැව් බැඳි දනව්වේ නවග්‍රහ බලි ශාන්ති කර්මය පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

වසන්ත කේ දිසානායක*

මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජ විද්‍යා හා මානව ශ්‍රස්ත්‍රපීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

*dwasantha@yahoo.com

කේන්ද්‍රීය වචන : අභිචාර, පූජාවිධි, සෙත් ශාන්ති, රෝග නිවාරණ

## හැඳින්වීම

''ආගම මිනිසාට ලෝකය පිළිබඳ උත්තරීතම අනුභූතියක් ( **Transcendental Experience**) ලබා දෙන බව'' ඒබ්‍රහම් මාස්ලෝ කියයි.1 මානව ජීවීන් විසින් තමන්ගේ එදිනෙදා ජීවිතයේ ගැටලු විසඳා ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම්හි නිරතව සාර්ථක ප්‍රතිඵල ලබා ගත නොහැකි විට බාහිර බලවේග හෝ අධිභෞතික බලවේග මඟින් පිහිට යැදීම නිසා බිහිවන අභිචාර තුළින් අධිභෞතික හෝ අධි මානුෂික බලවේග ( **Supernatural Beings**) තෘප්තිමත් කරමින් මානව අවශ්‍යතා සඳහා පිහිට ආධාර පැතීමට මිනිසා පෙළඹී ඇත.2

අභිචාර විධි අනුකරණ මන්ත්‍ර ගුරුකම් (**Witchcraft**) ලෙස හඳුන්වන **James George Frazer** මෙකී මන්ත්‍ර ගුරුකම් සමාජයට හානි දායක කටයුතු සිදුකිරීම සඳහා ( **Black Magic**) මෙන්ම සෙත ශාන්තිය යහපැවැත්ම සඳහා (**White Magic**) ද ලොව පුරා ජනතාව යොදා ගන්නා බව පෙන්වා දෙයි.3 අතීතයේ සිට ලක්දිව පැවත ආ මෙම ඇදහිලි විශ්වාස පසුකාලීනව දේව මංගල්ල ශාන්ති කර්ම දක්වා වර්ධනය වී මිනිසා සමඟ ඓන්ද්‍රීයබද්ධව පවතී.

තත් ක්‍රියාකාරකම් පද්ධතිය අඛණ්ඩව සම්ප්‍රේෂණය කිරීම සම්ප්‍රදාය ( **Tradition**) නමින් හඳුන්වයි. ඕනෑම මානව සමාජයකට සර්ව සාධාරණ වූ සම්ප්‍රදායකත්වයක් (**Traditionalism**) දෘෂ්‍යමාන බවත් ඒ තුළ සමස්ත සමාජයේ සමාජ දර්ශනය (**Social Philosophy**) ඥාන සම්භාරය (**Wisdom**) තාක්ෂණ ක්‍රමවේදය (**Technology**) සමාජයේ චාරිත්‍ර වාරිත්‍ර පද්ධතිය (**Social Ethics**) වතාවත් (**Ritesand Rituals**) ආදී වු සියලු අංග අන්තර් ග්‍රහණය වී ඇති බවත් පිළිගැනේ.4 ස්වභාව ධර්මය සමඟ සහජීවන පැවැත්මක් උදෙසා නිර්මාණය කර ගන්නා ලද සම්මුතීන් ඔස්සේ ලැබූ අත්දැකීම් හා අත්විඳීම් මත පදනම් වී උරුම කොට ගත් මේ දැනුම් සම්භාරයන් පරම්පරාවෙන් පරම්පරාවට වාච්‍යාර්ථයෙන් පවත්වා ගෙන එනු ලැබ ඒවා සියල්ල සම්ප්‍රදායන් බවට පත් අයුරු ජන ශිෂ්ටාචාරයේ ස්ථර විමර්ශනය කිරීමෙන් ප්‍රත්‍යක්ෂ කොට ගත හැකිය.

නුවරකලාවිය හෙවත් වැව්බැඳි දනව්වේ වෙසෙන ජනතාවගේ ඇදහිලි විශ්වාස ආකල්ප සාර්ධරම ඇසුරින් පෝෂණය වූ නවග්‍රහ ශාන්ති කර්මය දිගුකාලයක් තිස්සේ

ඔවුන්ගේ ඕනෑඑපාකම් සපුරමින් පවති. මෙම ශාන්ති කර්මය පැවැත්වීමෙන් සෙත ශාන්තිය සැලසෙන බව එම ප්‍රදේශවාසීහු තරයේ විශ්වාස කරති. ශ්‍රී ලංකාවේ ප්‍රචලිතව ඇති අනෙකුත් නවග්‍රහ ශාන්ති කර්මයන්ට වඩා විශේෂ ලක්ෂණ නුවරකලාවිය නවග්‍රහ ශාන්ති කර්මය තුළ අන්තර්ගතව පවති. තත් ප්‍රදේශයේ මෙකී ශාන්ති කර්මය ප්‍රධාන වශයෙන් පවත්වන්නේ මිනිසාට බලපාන නවග්‍රහයින් වන රවි, චන්ද්‍ර, කුජ, බුධ ,ගුරු, ශුක්‍ර, ශනි ,රාහු කේතු නිසා පැමිණෙන අපල උපද්‍රව දූරිභූත කිරීම අරභයාය. මේ තුළ දක්නට ලැබෙන විශේෂත්වය වන්නේ මෙම ප්‍රදේශයටම ආවේණික වූ පූජා විධි රටාව, පරමාර්ථ, අභින පද, වාද්‍ය භාණ්ඩ, සැරසිලි, යාදිනි , කෝල්මුර ආදියේ වූ අනන්‍යතාවයයි.

නවග්‍රහයින් ප්‍රධාන කොට අයියනායක දෙවියන්, පුල්ලෙයාර්, කඩවර, ශක්‍ර, බ්‍රහ්ම, විෂ්ණු, පත්තිනි, රත්නකම්බිලි, ගම්භාර, සූනියම් හා මහී මැණියන් ප්‍රධාන වූ අල්පේශාක්‍ය මහේශාක්‍ය සමස්ත දේව මණ්ඩලය උදෙසා බුලත් මඩ මල් යහන් දිෂ්ටි කොට දී උඩැක්කි කෝල්මුර යාදිනි මධ්‍යයේ ආතුරයා හට හත් අඩියේ දෙහි කපා තුන්යාමයට සතර කොණ ගොටු කැප කොට දී පැදුරේ සමයන් දී ආතුරයා පිරිත් පැනින් නාවා දේවාශිර්වාද පවත්වා අවසානයේ රීරි කඩවර ඇතුළු යකුන්ට දොළ දී නිමාකරන මෙම ශාන්ති කර්මයේ පූජාවිධි රටාව එකකට එකක් බද්ධ වූ සංකීර්ණ ක්‍රියාදාමයකි.
තත් ප්‍රදේශයටම පමණක් අනන්‍ය සාධාරණව පවතින මෙම නවග්‍රහ ශාන්ති කර්මයේ ඉපැරණි සංස්කෘතිකාංග හා ඒ තුළ අන්තර්ගත හර පද්ධතිය නූතන සමාජයෙන් වියැකී යාමට ප්‍රථම සංරක්ෂණය කිරීම කාලෝචිත යයි හැඟේ.

## අරමුණු

1. ප්‍රාථමික ස්වභාවික නීතිය (**Natural Low**) පිළිගනිමින් ඒවා ක්‍රියාත්මක කරමින් මානව අවශ්‍යතා ඉටුවන අයුරු විමසීම.
2. ගැටලු නිරාකරණය, සාමකාමීව ගැටීමේ විධි, සාමූහික ක්‍රියා (**Community Action**), විනිශ්චය කිරීම් (**Adjudication**), රෝගියාගේ අපේක්ෂා, මානසික සුව කිරීමේ ක්‍රම භාවිතය පිළිබඳ විමසීම.
3. මානසික හා සාමයික උන්නතිය උදෙසා යාතු කර්ම වලින් සිදුවන සමාජ සන්නිවේදනය.
4. ස්වභාව දහම පූජනීයත්වයට පත් වන ආකාරය විමසීම
5. මෙම ශාන්ති කර්මයේ පූජා විධි රටාව ප්‍රභේද සහසම්බන්ධතා අනන්‍යතා ලක්ෂණ විමසීම.
6. සංස්කෘතික වටිනාකමකින් යුත් මෙකී යාතු කර්ම වල ඇති වැදගත්කම සොයා බලා මතු පරපුරට දායාද කිරීම.

## ක්‍රමවේදය

මෙහිදී යොදා ගත් මූලික ක්‍රමවේදය වන්නේ ක්ෂේත්‍ර අධ්‍යයන සහ මූලාශ්‍ර අධ්‍යයනයයි.

1. ක්ෂේත්‍ර අධ්‍යයනය සග සහභාගිත්ව නිරීක්ෂණය

හොරොව්පතාන පරංගියා වාඩිය ආදී ස්ථානයන්හි පැවැත්වූ නවග්‍රහ ශාන්ති කර්මයන් නරඹා අවශ්‍ය තැන් වලදී ඡායාරූප වලට ගැනීම. හඬපට වලට ගැනීම යකැදුරන් හා ආතුරයන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා තුළින් අවශ්‍ය දත්ත සම්පාදනය කිරීම.

2. මූලාශ්‍ර

මේ සඳහා ප්‍රධාන වශයෙන්
1. ප්‍රාථමික මූලාශ්‍ර
ඇඳුරු පරම්පරාවන් සතුව ඇති නවග්‍රහ ශාන්ති පිළිබඳ අත්පිටපත් පුස්කොළ පිටපත් කෝල්මුර කවි පූජාවිධි රටාව ඇතුලත් පිටපත් හා සම්මුඛ සාකච්ඡා තුළින් ලබාගත් තොරතුරු ඇතුළත්ය.

2. ද්විතීයික මූලාශ්‍ර

මේ සඳහා අදාළ මුද්‍රිත හා අමුද්‍රිත කෘති පරිශීලනය කිරීම.

## නිගමනය

රෝග නිවාරණය හා මානසික සන්තුෂ්ටිය උදෙසා මිනිසා සතුව පවත්නා අදෘශ්‍යමාන බලවේගයන් තුළින් රැකවරණය ආරක්ෂාව පිහිට අපේක්ෂා කිරීමේ ක්‍රියාවලිය තුළ අන්තර්ගත අභ්‍යන්තර හර පද්ධතිය සුළුකොට තැකිය යුතු නොවේ. එක්ව ක්‍රියාකිරීම, සමගිය, චිත්තශක්තිය වර්ධනය වීම, සමාජ සන්නිවේදනය, ස්වභාව දහම හා ඇති බැදියාව තහවුරු වීම, මානසික ඒකාග්‍රතාවයට පත් වී සුවපත් වන මනස තුළින් ශාරීරික අපහසුතා මඟ හැරීමේ මානසික රෝග නිවාරණයක් ලෙසට මෙම ශාන්තිකර්මයන් තුළ පවත්නා වටිනාකම අගය කළ යුතුය. එමෙන්ම දේශීය පාරම්පරික ශාන්ති කර්ම තුළ අන්තර්ගත සංස්කෘතික වටිනාකම අගය කිරීම හා රැක ගැනීමේ අවශ්‍යතාවය ඒ තුළින් ඉස්මතු වෙයි.

## පරිශීලිත කෘති


1. රත්නපාල, නන්දසේන. මානවවිද්‍යාව, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ, 2001, 252 - 253 පිටු.
2. රත්නායක, අබේ. සමාජවිද්‍යා මානවවිද්‍යා න්‍යාය පළමු කොටස, ප්‍රින්ටඩ් මුද්‍රණාලය, මහනුවර, 1999, 222 පිටුව.
3. **Frazer J 1994, *The Golden Bough,* Chamcellor press Michel in house, London, pp. 62.**
4. හෙළමග විසිතුරු. සංස්. පණ්ඩුල ඇඳගම, සර්වෝදය විශ්වලේඛා, රත්මලාන. 2003, 37 පිටුව.
5. **Malinoaski, Branislaw 1948, *Magic Sciences and Religion*, Boston, pp. 6.**